NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

**10 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **ඒකකය 16: එතෙපුල් අමා හැල්ලෙන්**

## I කොටස

- **ඉරි ඇඳි පදයෙහි අරුතට සමාන අරුත ඇති පදය තෝරන්න.**

01. තමන් වහන්සේගේ කරුණා නමැති <u>අකුස්සෙන්</u> පැහැර ඇතු රඳවාලා...

(1). කොස්සෙන් (2). හෙණ්ඩුවෙන් (3). පාදයෙන් (4). හස්තයෙන්

02. මා පැමිණියා වූ මේ වීථියෙහි මේ මද නැඟි ඇත් <u>කිහිඹියක</u> ගහටා මරාපී නමුත් මාගේ කවර නම් බුද්ධානුභාවයෙක් ද...

(1). කකුළුවෙකු (2). කුකුලෙකු (3). කුහුඹුවෙකු (4). සර්පයෙකු

03. ඇතු ළං වත් වත් ම ජනයා <u>මුහුණු අත් දෙන්නට</u> වන්හ.

(1). මුහුණ දෑතින් වසා ගැනීම.
(2). දෑත මුහුණේ ගසා ගැනීම.
(3). දෑත් මුහුණින් ඉවත් කිරීම.
(4). දෑත් ඉවත තබා ගැනීම.

04. සැදැහැත්තෝ <u>ළෙහි</u> අත් ගසන්නට වන්හ.

(1). රුධිරයෙහි (2). හිසෙහි (3). ළයෙහි (4). නිකටෙහි

05. බුදුන්ගෙ රූසිරු බලා <u>පිළිලදු</u> සංවේග ඇති වූයෙ.

(1). අවබෝධයෙන් යුතුව
(2). අනවබෝධයෙන් යුතුව
(3). ඇතිකරගත්
(4). සංවරව

- **06 සිට 07 තෙක් ඇති ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.**

06. (1). උන්වන්සේ ප්‍රාචීන ප්‍රතිචීන භාෂාහි හසළ දැනුමැති ප්‍රාඥයෙක් වූහ.
(2). සඤ්ඤක අක්ෂර වූ කලී සිංහල භාෂාවට ම අනන්‍ය වූ අක්ෂර විශේෂයකි.
(3). සිංහල භාෂාව ලේඛණය හා කතනය ලෙස ද්වි රූපතාවෙන් යුක්ත වේ.
(4). පාසලේ දී අර්ථවත්ව පලදායී ලෙස කාලය ගත කළ හැකි හොඳම තැනකි පාසල් පුස්තකාලය.

07. (1). කණිෂ්ඨ, ඖෂධ, පරිගණක, ආකර්ෂණීය
(2). සමනල, කොට්ඨාස, රිද්මයානුකූල, ඓතිහාසික
(3). විශ්ලේෂණ, සමාර්ථ්‍යය, නිඃශබ්ද, ප්‍රාසංගික
(4). ස්වාභාවික, ව්‍යංග්‍යාර්ථ, කැලණිය, විද්‍යුතය

08. විරාම ලක්ෂණ වඩාත් නිවැරදි ලෙස යොදා ඇති නිවැරදි වරණය වන්නේ කුමක්ද?

(1). ''නාලාගිරිය, තා මේ වීථියට හළුයේ තෙල කුමාරයා නිසා නොවෙයි. අප නිසාය.''
(2). 'නාලාගිරිය! තා, මේ වීථියට හළුයේ තෙල කුමාරයා නිසා නොවෙයි. අප නිසාය.'
(3). ''නාලාගිරිය! තා මේ වීථියට හළුයේ තෙල කුමාරයා නිසා නොවෙයි, අප නිසාය.''
(4). ''නාලාගිරිය; තා මේ වීථියට හළුයේ තෙල කුමාරයා නිසා නොවෙයි. අප නිසාය.''

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

09. (i). සඳකඩ .................... ළඟ ඇවිළෙන .................... දීප්තිමත් ය.

(ii). වළක් .................... කෙසෙල් .................... වලට දමන්න.

(iii). බහු ජාතික සමාගම් නිසා .................... ව්‍යාපාර කඩා වැටෙන .................... ය.

(iv). බෝගල .................... ලොව .................... ය.

ඉහත සඳහන් ප්‍රකාශවල හිස්තැන් පිරවීමට නිවැරදි වචන යුගලය ඇති වරණය කුමක්ද?

| (1). | | (2). | | (3). | | (4). | |
|---|---|---|---|---|---|---|---|
| පහණ - පහන | | පහන - පහණ | | පහණ - පහන | | පහණ - පහන | |
| කැණ - කැන | | කැන - කැණ | | කැන - කැණ | | කැණ - කැන | |
| සුළු - සුලු | | සුලු - සුළු | | සුළු - සුලු | | සුළු - සුලු | |
| පතල - පතළ | | පතළ - පතල | | පතල - පතළ | | පතළ - පතල | |

10. උපමාවක් නොයෙදුණු වරණය තෝරන්න.

(1). යුගාන්ත වාතයෙන් නැමීයන අඳුන් කුළක් සේ.

(2). මෙසේ ම තුන් වාරයක් හි ම බුදුන් පසුකොට ඇතු පෙරට වූ සේක.

(3). ආකාශයෙහි පිපි වැනී ගිය තරු කැලයක් සේ.

(4). කෝපයෙන් රත්වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජු.

11. පහත ප්‍රශ්න හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

(1). විදුසක්විති පොළොන්නරු යුගයේ දී අමාවතුර රචනා කරන ලදී. ( )

(2). අමාවතුරෙහි දාහතරවන පරිච්ඡේදය නාග දමනයයි. ( )

(3). පුරිසධම්මසාරථී බුදුගුණය නව අරහාදී බුදුගුණවලින් එකකි. ( )

(4). දඹදෙණි යුගයේ දී රචිත පූජාවලිය රාජ රාජ මහා මාත්‍යාදීන්ගේ උතුම් වූ පුද පූජාවට ලක් වූ කෘතියකි. ( )

(5). බුද්ධ පුත්‍ර හිමි විසින් අරහං බුදුගුණය මුල්කර ගනිමින් පූජාවලිය රචිතය. ( )

(ලකුණු 2 × 15 = 30)

## II කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. ''වහන්සෙ, මෙ ඇත් චණ්ඩ යැ, පරුෂ යැ, මිනීමරු යැ, යුගත් ගිනි වැන්නැ, පළමු මා මරා පසු තොප වහන්සෙ කරා යෙව''

(අ). මෙය උපුටාගත් කෘතිය කුමක්ද?

(ආ). ඉරි ඇඳි පදයෙහි අරුත කුමක්ද?

02. ''ඇතැ එබු එබූ පයින් මහ පොළොව පළාපියන්නා සෙ දිවන ඇත් රජ යැ, මැත එබු එබූ පයින් මිහි කත සනහ සනහා වඩනා බුදුරජාණෝ යැ...''

(අ). ඉහත උද්ධෘතයෙහි ශබ්ද රසය මතු කිරීමට යොදන ලද සහ

(ආ). අර්ථ රසය මතු කිරීමට යොදන ලද උපක්‍රමය කුමක්ද?



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

03. ''එ රූ අමා ඇසින් උකා බොමින්, සිටැ-පියැ නොහී, නැමෙමින් හැකිළෙමින් ශ්‍රී පාදය ඇලයට ගොසින් සිටියෙ.''

(අ). ඉහත කියවෙන්නේ කව්රුන් පිළිබඳව ද?

(ආ). මෙම කොටස ඇතුළත් කෘතිය රචිත යුගය කුමක්ද?

04. ''මා පැමිණියා වූ මේ විරීයෙහි මේ මද නැඟි ඇත් කිහිඹියක ගහටා මරාපී නමුත් මාගේ කවර නම් බුද්ධානුභාවයෙක් ද''

(අ). මෙම අවස්ථාව හා සම්බන්ධ චරිත දෙකක් ලියන්න.

(ආ). මෙම උද්ධෘතය ඇතුළත් කෘතියේ රචකයා කව්රුන්ද?

05. ''ආකාශයෙහි පිපී වැනී ගිය කරු කැලයක් සේ පිරිවරා සිටිනා රහත් පෙළකින්''

ඉහත දී ඇති උපමාවෙහි උපමානය හා උපමේය වෙන් කරන්න.

06. පහත වාක්‍යයෙහි පවතින අක්ෂර වින්‍යාසය සදොස් වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

භාවික ගුණය යනු රසිකයාගේ භාවයන් ප්‍රබෝදවත් කොට ඔහු මැනවින් අත්දකීමට සහබාගි කරවා ගැනීමේ හැකියාවකි.

07. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් ලියන්න.

(අ). මලු

(ආ). මළු

08. සුදුසු පරිදි විරාම ලකුණු යොදා නැවත ලියන්න.

ඇදුරුතුමනි මම හෙට සවස තුනට එමි

09. මූර්ධන 'ණ' කාරය හා සම්බන්ධ රීති දෙකක් ලියන්න.

10. සමාන පද ලියන්න.

(අ). අමෘතය

(ආ). මෙත්

(ලකුණු 20)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk



agaram.lk